කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු/ සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

**සිංහල (පැරණි නිර්දේශය)**

**සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව SINH – E 2015**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

## 1 කොටස

01. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා කතුවරයා සතු අවස්ථා නිරූපණ කුසලතාව අගයන්න.

තව ද, තමන්වහන්සේ කෙරෙහි නිෂ්කාරණයෙහි වෛර බැන්දා වූ දෙව්දත්හු තමාගේ නුනුවණින් "බුදුන් මරා බුදු වෙමි"යි සිතා අජාතශත්‍රැරජ්ජුරුවන් පහදවා ගෙණැ 'තමන්වහන්සේ විදිනට යැ'යි කියා දුනුවායන් මෙහෙයූ කල්හි, ඔවුන් තමන්වහන්සේගේ බණ අසා අමාමහනිවන් දුටු කල්හි, එසේ ද සිතැ ඇත්ත සාධා ගත නොහී, තව ද ගිජ්ඣකූටපර්වතයෙහි සක්මන් කරන්නා වූ තමන්වහන්සේගේ සිගාවට මහත් ගලක් පෙරළා, එ ගල සිගාවට ආසන්න වූ කල්හි මහපොළොව පළාගෙණැ දෙගලක් නැඟී, හෙන ගල නො හියැ දී ආකාශයෙහි මැ රඳවා උපද්‍රව නො වියැ දුන්කල්හි, හැම පරිද්දෙන් මැ තමා සිතැ ඇත්ත සාධා ගත නො හී "බුදුගුණ නො දන්නා බුදුරුවෙහි රස නො දන්නා යහපත නො දන්නා මදයෙන් තමා නො හඳුනන තිරිසනක්හු ලවා ඔවුන් මරවමි"යි සිතා අජතශත්‍රැරජ්ජුරුවන් කරා ගොසින් ""මහරජ, තෙපි තොප සිතැ ඇත්ත සාධා තොප පිණැති හෙයින් පියාණන් මරා රජ වූහැ. අප පින් මඳහෙයින් බුදුන් මරා බුදු වියැ නො හෙන්නමු ඇපි වමෝ දැ'යි මැසිවිලි කියා, රජ්ජුරුවන් විසින් ""වහන්ස එයට කට හැකි කිම් ද? නුඹ මැ හිසට පෙරළා ලූ ගල් පොළොවින් දෙගලක් නැඟී පිළිගත. අප යවු දුනුවාවෝ හයාගත් හීදඬු හැරැපියැ නො හී සිතියමැ ඇන්දා සේ සිටැ ඔවුන්ගේ බණ අසා අමාමහනිවන් දුට්හැ.

02. අනුරාධපුර යුගයේ ගද්‍ය සාහිත්‍යයේ කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳ සමාලෝචනයක් කරන්න.

03. <u>බුත්සරණ</u> භක්ති කාව්‍යයක් ලෙස සැලකීම කොතෙක් දුරට යුක්ති යුක්ත දැයි සනිදර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

නැතහොත්

<u>සද්ධර්මරත්නාවලී</u> කතුවරයා සතු භාෂා නිපුණතාව නිදසුන් ඇසුරෙන් පහදන්න.

## II කොටස

04. බැද්දේගම නවකතාවේ ඇතුළත් මුඛ්‍ය චරිත පිළිබඳ විග්‍රහයක් කරන්න.

05. විලාසිනියකගේ ප්‍රේමය නවකතාවෙහි ගැබ් වූ අපූර්ව ලක්ෂණ අරභයා සනිදර්ශන විග්‍රහයක් සපයන්න.

06. පහත සඳහන් කෙටිකතා අතරින් එක් කතාවක් පිළිබඳ විචාරාත්මක ඇගයීමක් කරන්න.

අ) වැලිතලප
ආ) පටු තීරය
ඇ) නිවුණු තේ කෝප්පය
ඈ) නෘත්‍යාගාරය

## III කොටස

07. කෝලම් නාට්‍ය කලාවේ කැපී පෙනෙන විශේෂතා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

08. සිංහබාහු නාට්‍යයේ තේමාව පිළිබඳ විමසීමක් කරන්න.

09. අකිර කුරොසවගේ රෂෝමොන් සිනමා කෘතිය පිළිබඳ ඇගයීමක් කරන්න.

10. සිංහල සිනමාවේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස තුංමංහන්දිය සැලකීම කෙතෙක් දුරට යුක්ති යුක්ත දැයි නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

******************************